

ඒකත් එක
කතාවක්
දිනිති නිර්මාණී රත්නායක
@3DAZE_AI

# ඒකත් එක

# කතාවක්

# ඒකත් එක

# කතාවක්

දිනිති නිර්මාණී රත්නායක

# පිදුම

අනේකවිධ  දුක් කම්කටොලු

මධ්‍යයේ

නොසැලී

ජීවිතය ජය ගන්නට

වෙර දරන ඔබ

සියලු දෙනාට...



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවින් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම් පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

CS CamScanner

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# <u>සුභාශිංසන පණිවුඩය</u>

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා භාරිකාව විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# 01

ජාවත්ත , කොළඹ පිහිටි එක ප්‍රධානත ම සුසාන භූමියකට එවකට තිස් දෙහැවිරිදි වූ යශෝධා අතුකෝරාළ මෙනෙවිය වසරකට වරක් පිය නඟන්නේ නිතැතිනි. එහි උපත 1962 පෙබරවාරි 21 දින ලෙසත් , විපත 1993 ජුනි 04 දින ලෙසත් සඳහන් ව තිබූ සොහොන් කොතක් මත ඉටිපන්දමක් දල්වා , මල් කළඹක් තබන්නට වූවා ය. සොහොන් කොතෙහි උඩින් ම වූ නම " අශ්වින් රඹුක්වැල්ල " බව , ඇගේ පෞද්ගලික ලේකම් වූ සතුෂ්මි හඳුනා ගත්තා ය . යශෝධා මෙනෙවිය සොහොන් කොත අසළින් නැඟිටින තුරු ඇය නොඉවසිල්ලෙන් බලා සිටියා ය.

" කවුද මැඩම් ඒ? මැඩම්ගේ නෑදෑ හිතවතෙක් ද? "

" නෑදෑ අය ඉතින් මට මේ ලෝකෙ නෑ සතුෂ්මි.. මට අවුරුදු හතේ දී මගෙ අම්මයි තාත්තයි කාර් ඇක්සිඩන්ට් එකක් වෙලා මගෙන් ඈතට ගියා... ඒ ඇක්සිඩන්ට් එක වෙලාවෙ දී මාත් කාර් එකේ පිටිපස්සෙ හිටියා.. ඒ වෙලේ වුණ අධික කම්පනය නිසා තමා මටත් මේ පොඩි ශ්‍රවණාබාධයක් තියෙන්නේ.. මම එදා ඉඳන් හැදුණෙ වැඩුණෙ හොස්ටල් එකේ.."

" සොරි මැඩම්.. මම ඒ ගැන දැනගෙන හිටියෙ නැහැ... ඉක්ස්ට්‍රීම්ලි අයැම් සොරි මැඩම්..."

" ඉට්'ස් ඕකේ සතුෂ්මි. කොහොමහරි මම ඒ මල් තිබ්බේ මගේ අම්මාටවත් , තාත්තාටවත් නෙමෙයි"

"එහෙනම් මැඩම්?"

" ඒ මනුස්සයා තමයි මම අද මේ ඉන්න තැන ඉන්න හේතුව.. අශ්වින් සර් නැතිවෙන්න මම මේ තනතුරුවල තියා ජීවතුන් අතරවත් නැහැ... අශ්වින් සර්ගේ පරිත්‍යාගය හින්දා තමයි මම අද මෙහෙම ඉන්නෙ... එතුමාගෙ දිනපොත තමයි මට ජීවිතේ අභියෝග ජය ගන්න ශක්තිය දුන්නේ... තවමත් එහෙමයි..."

එවකට ආබාධිත පුද්ගලයන් පිළිබඳ මහලේකම් කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ තනතුර හෙබ වූ යශෝධා මෙනෙවියගේ මුවින් ' සර් ' යන වදන පිට වූ මොහොතේ සිට සතුෂ්මිගේ සිත තුළ මෙම පුද්ගලයා කවුද කින්ද මන්ද යන වගතුග සෙවීමට වූ උනන්දුව තව තවත් වැඩි විය.

" ඉතින් මැඩම්, අශ්වින් සර් කොහොම ද මැඩම්ගේ ජීවිතේට සහ සම්බන්ධ වුණේ? "

" ඒක හුඟාක් දිග කතාවක් සතුෂ්මි " යි කියමින් යශෝධා තම නිළ රථය වෙත ගමන් කළා ය.

* * * * **

මාර්ග තදබදය නිසා පැය භාගයක පමණ ධාවනයකින් පසු යශෝධා තම නිල නිවස වෙත ළඟා වූවා ය. නමුත් ගමන ආරම්භයේ සිට මේ දක්වා ම , තම

නොසැලකිලිමත් බව එම උතුම් ජීවිතය බිලි ගත්තා දැ යි වූ වරදකාරී හැඟීමත්, තමා ඔහුට දක්වන කෘතගුණ පූර්වක බවෙහි යම් අඩුවක් පවතින්නේ දැ යි වූ සිතුවිල්ලෙහිත් ඇය පරක් තෙරක් නොමැති ව ගිලී සිටියා ය. සියලු වරදකාරී හැඟුම්වලින් තාවකාලික ව හෝ මිදීමේ අරමුණින් ඇය නාන කාමරය වෙත ගොස් නැවුම් වූවා ය .

නැවතත් තම රාජකාරීමය කටයුතු ආරම්භ කරන්නට ඇය සවස් වරුව යොදා ගත්තා ය. ඇගේ නිදන කාමරයේ පොත් රාක්කය තුළ තිබී ඇගේ ජීවිතයේ හැරවුම් ලක්ෂ්‍යය වූ " අශ්වින් " ලෙස ඉංග්‍රීසි අත් අකුරින් හැඩ ගැන්වුණු දින පොත ඇගේ නෙත ගැටිණි. පොත දෝතට ගෙන කවරයේ දූවිලි පිස දමන විට ඇගේ දෙනෙත් කඳුළින් තෙත් වනු ඇයට දැනුණි. මේ එලෙස සිදු වූ ප්‍රථම අවස්ථාව ද නොවේ. මෙම පොත අතට ගන්නා සෑම අවස්ථාවක් පාහේ ම ඇයට එලෙසින් ම දැනුණි. ඉක්බිති ව නෙතු අග රැඳි කඳුළු පිස දැමූ ඇය , කෝපි වීදුරුවක් ගෙන එන ලෙස සුගුණපාලට දැන්වූවා ය.

කෝපි වීදුරුව ද රැගෙන , දිනපොත දෝතින් ම වැළඳගෙන සඳළුතලය වෙත ඇය සෙමෙන් පිය නැඟුවා ය. එහි වූ සිමෙන්ති බංකුවක හිඳගෙන , ඇය නැවතත් කඳුළින් බර ව ගිය දෙනෙතින් අහස් කුස වෙත සංග්‍රහ කළේ " ඔයා මා දිහා බලාගෙන නේ ද ඉන්නෙ අශ්වින් සර්...මං දන්නවා මගෙ දියුණුවට සර්ගේ ආශිර්වාදෙ මට හැමදාම ලැබෙනවා කියලා " ලෙසින් පවසන්නාක් වැනි වූ බැල්මකිනි

ගැඹුරි සිතුවිලි රැසක නිමග්න ව සිටි යශෝධා මෙනෙවිය ඇයටත් නොදැනිම එම බැල්ම එලෙසින් ම රඳවා ගත්තා ය. තමා වසර ගණනාවක් තිස්සේ පැළඳි

ශ්‍රවණාධාරකය ගලවා පසෙකින් තැබුවා ය. එය ද ඇයට හිමිකර දුන්නේ අශ්වින් සර් විසිනි. ඔහුගේ දිනපොත තුළින් ලද ජීවිත කතාව පිළිබඳ දැනුමත් , ඔහු තමා සමඟ රැඳි හෝරා කිහිපයක මතකයත් ද සමඟින් " අශ්වින් රඹුක්වැල්ලගේ " ජීවිත කතාව ඇය නැවතත් සිහි කරන්නට වූවා ය.

# 02

60 වැනි දශකයේ පුත්තලම දිස්ත්‍රික්කයේ වනාතවිල්ලුව නම් ප්‍රදේශයේ කුඩා කටුමැටි ගෙපැලක් තුළ අළුතින් අතැඟිලි එක් වූ යුවළක් ඉතා සතුටින් කල් ගත කළහ . සැමියා " මුරමුදලි මුදියාන්සේලාගේ සිරිසෝම  " නම් සිංහල ජාතිකයෙකු ද , බිරිය " ලක්ෂ්මි " නම් හින්දු කාන්තාවක ද විය.සිරිසෝම සාමාන්‍ය දුරට පවා අධ්‍යාපනය නොලබා ඇති නිසා කුරුණෑගල පෙදෙසෙහි හේනක පැල් රැකීම තම ජීවිකාව කර ගත්තේ ය.ලක්ෂ්මි ද තම ස්වාමියාට අවංක ව ගේ දොර වැඩපළ මැනැවින් සිදු කරමින් ආදරණීය බිරින්දෑවක ලෙස කල් ගෙවුවා ය.

අලුතින් විවාහ වූ මෙම යුවළගේ මීළඟ එකම අපේක්ෂාව වූයේ දරු සම්පතකි. සිරිසෝමගේ අප්‍රතිහත ධෛර්යය නිසා මෙම යුවළට භව භෝග සම්පතින්

කිසිදු අඩුවක් නොවී ය.ඔවුන්ගේ එඅක ම පැතුම ද මල්ඵල ගන්වමින් , ලක්ෂ්මී දරුවෙකු කුස පිළිසිඳ ගත්තා ය.

තම ලෝකය ම බඳු වූ ආදරණීය බිරිඳත් , නූපන් දරුවාත් සතුටින් තැබීමට සිරිසෝම තමාට හැකි සියලු දෑ සිදුකළේ ය. ඔවුන්ගේ අනාගතය තව තවත් සරුසාර කරවීමේ අරමුණින් සිරිසෝම තව තවත් වෙහෙස මහන්සි වී වැඩ කළේ ය.

මෙලෙසින් මාස පහ හයක් පමණ ගත විය. සාමාන්‍යයෙන් අලුයම පහ පමණ වන විට නිවසට සේන්වූ වන සිරිසෝම , තවත් අඩ හෝරාවක් පමණ ගත වන තුරු ම නිවසට ආවේ නැත. ලක්ෂ්මීගේ සිත තුළ අඳුරු සිතුවිලි රැසක් අරක් ගත්තේ ය. " මං එන්ට පරක්කු වුණාට කාරි නෑ ... මැණිකෙ කලින් කාලා බුදියා ගන්ට... ඒක දරුවාටත් හොඳා නෙ වැ... " පෙර දිනක ද මෙලෙසින් පමා වූ විට සිරිසෝම පැවසූ වදන් සිහි වූ ලක්ෂ්මී , නැවතත් ශුභවාදී වදන්වලින් සිත පුරවාගෙන නිදන්නට වූවා ය.

" ලක්ෂ්මියේ.... ලක්ෂ්මියේ....."

හතිලමින් කෑගැසූ විලාපයක් වැනි ආමන්ත්‍රණයකින් හිරු උදාවත් සමග ම ලක්ෂ්මී නැවතත් අවදි වූවා ය. අවුල් ව ගිය හිසකේ ද අතින් සකසමින් දොරකඩ වෙත ඇය හැකි අයුරින් දිව ආවා ය.

" මේ මොකෝ අක්කෙ මේ මහ පාන්දර හදිස්සියේ ... පොඩි එවුන්ට ලෙඩක් දුකක් වත් ද ? " දමිළ කාන්තාවක වුව ද ලක්ෂ්මී මැනැවින් සිංහල බස හසුරුවන්නට වූවා ය .

" නෑ.. නෑ.. නංගියේ.... උඹ මේ ආරංචිය අහලා හිත කලබල කොරගන්ට එපා...

"කියන්ටකො අක්කේ මා ව තවත් බය ගස්සන්නේ නැතිව..."

" සිරිසෝම මලයාට හේන් පැල රැකලා එනිං ගමං ඉද්දින් අලියෙක් ගහලා වැටිලා ඉන්නවා සියදෝරිස් දැක්කායි කියලා...."

අවසන් වදන් පෙළ කාන්ති හට සම්පූර්ණ කරන්නට වූයේ නැත. ඒ වන විටත් ලක්ෂ්මී සිහිසුන් ව ඇද වැටී ය.

හෝරා කිහිපයකට පසු ලක්ෂ්මී පියවි සිහියට පැමිණෙන විට සිරිසෝමගේ දේහය නිවස වෙත ගෙනැවිත් තිබුණි.සිරිසෝමට ආදරය කළ බාල මහළු සියලුම ගම්වැසියන්ගේ විලාප නද ගම පුර රැව් පිළි රැව් දෙන්නට විය. තමා වෙනුවෙන් ඔහුගේ ගතත් සිතත් වෙහෙසවමින් , තමා ව රැකබලාගත් ඒ ආදරණීය පුරුෂයාගේ ගතත් සිතත් එකවර ම නිසල ව ගොසිනි. ඇයගේ තලෙලු පැහැ දෙකම්මුල් හරහා කඳුළු වැල් ගලා යන්නට විය.

" ඉස්සරහට මොන දේ උනත් කාරි නෑ... මයෙ මැණිකෙ දුකින් අඬන්ට දොඩන්ට හොඳ මදි..."

ඔහුගේ නික්ම යාමට පෙර දින රාත්‍රියේ ද ඔහු පැවසූ සැටිත් , ඔවුන්ගේ ආදරණීය මතක සියල්ලත් එකිනෙක ලක්ෂ්මීගේ සිතට ගලා එන්නට විය.ඒවා එකිනෙක සිතුවම් ලෙසින් තමා ඉදිරියේ මැවි මැවී දිස්වෙද්දී , නැවතත් ඔහුගේ නිසල සිරුර දකින විට ඒ සියල්ල , මැවූ සිහින සියල්ල ද සමඟින් බොඳ වී යන්නට විය.

ඇය අවමංගල සභාවට රැස් ව සිටි අයගෙන් අඩක් පමණ පිටවන තුරු ම සියල්ල ඉතා ආයාසයෙන් දරා උන්නා ය. පසුව තම ස්වාමියාගේ පපුතුර මත හිස හොවාගෙන හැඬුම නවත්වා ගැනීමට වෑයම් කළා ය. වන අලි පහරින් මදක් ඉදිමී ගොස් තිබූ ඔහුගේ ශාන්ත පෙනුමින් යුත් මුවඟ දකින විට , මේ සියල්ල තමාගේ හා දරුවාගේ සතුට වෙනුවෙන් කළ කැපකිරීම නිසා නොවේ දැ' යි ඇගේ සිත කඩා වැටෙන්නට විය.

මඳ වේලාවක් මෙලෙසින් ම ගත වී ගිය පසු ගම්වැසියන් කිහිප දෙනෙකු පැමිණ සිරිසෝමගේ තරුණ  ශක්තිමත් සිරුර කර මතට ගන්නට වූහ. මිහිදන් කිරීමේ කටයුතුවලින් පසු සිරිසෝමගේ අවසන් කටයුතු නිමැවිණ. එතැන් පටන් ලක්ෂ්මිගේ දිවි ගමන ද කිසිඳු තෘප්තියකින් තොර ව මැලවී ගිය , ඇවිදින මළ මිනියක් බවට පත් විය.

* * * * * *

කාලයාගේ ඇවෑමෙන් ලක්ෂ්මිගේ දරු ප්‍රසූතියට දින ළංවිණි. සිය ස්වාමියාගේ අභාවයෙන් තමා ට අවශ්‍ය ආහාර පාන මෙන් ම මානසික සතුට , ආදරය හා සෙනෙහස ද නොලැබී යාම නිසා ලක්ෂ්මි ගතින් මෙන් ම සිතින් ද දුබල වූවා ය.

දින ගතවීමත් සමග වින්නඹු මාතාව ඇමතූ ලක්ෂ්මි ,

" අසෝකා අක්කෙ , මේ දරුවා ඉපදුණාට පස්සේ මම ඉන්ටත් ඇහැකි.. නොඉන්ටත් ඇහැකි... අක්කා දනී නෙවැ, මමයි සිරිසෝමයි සතුටින් උන්නාට මොකෝ ජාති දෙකක , ආගම් දෙකක... ඉතින් අපේ දරුවා මේ දෙවරිගෙට ම අයිතියි... ඒ හන්දා මේ දරුවා ඉපදුණායින් අහවර වෙලා ' රඹුක්වැල්ල මුදියාන්සේලාගේ අශ්වින් මුරමුදලි ' කියලා නම් තියන්ට..."

නියමිත දින උදාවිය. සිරිසෝමගේ අවසන් සිහිනය මල්ඵල ගන්වමින් අශ්වින් මෙලොව එළිය දැකීම එලෙස සිදු ව තිබුණ ද , ලක්ෂ්මිගේ ආත්මය සිරිසෝම සොයා  යාම ද එකෙණෙහි ම සිදු ව තිබුණි. වනාතවිල්ලුවෙහි විසූ වින්නඹු මාතාවෝ තම යුතුකමක් ලෙස මව මියගිය දරුවන් සාස්තරකරුවන් වෙත ඉදිරිපත් කරන්නෝ ය. මේ දරුවා ව ද අසෝකා අක්කා විසින් සාස්තරකරුවන් වෙත පෙන්වන ලදී

" මේ දරුවට ආබාධ බෝමයක් උපතින් ම ඇවිදින් තියෙනවා... දිව, උගුර, කන් ආශ්‍රිත ආබාධ ... මේ දරුවගෙ හිතත් සිරිසෝමගෙයි ලක්ෂ්මිගෙයි වගේ ම හොඳ උනාට මොකෝ දුක් ගැහැට පොදියකට මූණ දෙන්ට වෙයි... බාග විට මේ දරුවගෙ ජීවිතෙ අකාලෙ නැති වෙන්ටත් ඉඩ තියෙන වග පේනවා...කෙසේ වෙතත් ඒක ඒ ආකාරෙට උණත් , මේ වගේ ම ආබාධ තියෙන දරුවෝ රාසියකගෙ යහපතට හේතු වෙන වග නැකැත් ශාස්ත්‍රෙන් කියන්ට පුළුවනි..."

සුළු ශරීරාබාධයක් වුව බාහිරින් දක්නට නොලැබුණ ද, ආරංචිය පැතිර යාමත් සමග බිළිඳු අශ්වින් ව කිසිවෙකු දරුකමට හදා නොගත්තෝ ය. එනමුත් ලක්ෂ්මිටත් , සිරිසෝමටත් කෙරෙන ප්‍රත්‍යුපකාරයක් ලෙස ආහාර පාන හා ඉගෙනුම් කටයුතුවලට අවශ්‍ය මූලික සහාය ලබා දීමට ගම්වාසීහු කටයුතු කළහ.

* * * * * *

# 03

ලක්ෂ්මිගේ පස් අවුරුදු පූර්ණ පිංකම එළැඹිණ. ඒ වන තුරු ම අශ්වින්ට කිරි පෙවුවේ හා කෑමබීම කවාපොවා රැකබලා ගත්තේ අසෝකා අක්කා විසිනි. ඇය වින්නඹු මාතාවක් ලෙස අවිවාහක ව තම දිවිපෙවෙත ඉදිරියට ගෙන ගියා ය. ඇය සිරිසෝමට දුරින් නෑදෑ සහෝදරියක් ද වූවා ය. එහෙයින් අශ්වින් හට අසෝකා නැන්දා නෑකමින් " නැන්දා " විය.

අශ්වින් සම්පූර්ණයෙන් ම ගොළු වූ ත්, කනෙහි සුළු ශ්‍රවණාබාධයක් සහිත බවත් අසෝකා නැන්දා මුලින් ම හඳුනා ගත්තේ අශ්වින් හට අකුරු කියැවීමට ගමේ පන්සල වෙත කැඳවාගෙන ගිය අවස්ථාවෙහි ය.

" ඕං දෙතුං විටක් ම මං පුතාගෙ අතින් අල්ලලා වැලිපිල්ලෙ ' අ' යන්න ලියවෙවුවා... දැං ඒක බලාන ආපහු ලියන්ට උත්සාහ කරහං කොලුවෝ "

ගමේ පණ්ඩිත හාමුදුරුවෝ අශ්වින්ට අකුරු කියාදීමේ ප්‍රයන්තය ආරම්භ කළේ එලෙසින් ය.

කිසිඳු ප්‍රතිචාරයක් අශ්වින්ගෙන් ලැබුණේ නැත. නැවත දෙතුන් වාරයක් ම ස්වාමීන් වහන්සේ එම වැකිය ම හඬනඟා පවසන්නට වූ කල්හි ඔහු ඉතාමත් පහසුවෙන් ' අ ' යන්න වැලිපිල්ල මත යුහුසුළු ව ලිවුවේ ය.

" දැන් ඒක ලියන්ට හොඳහැටි තේරුණා ද ? "

දෙතුන් වරක් ම පණ්ඩිත හාමුදුරුවෝ වර නගමින් විමසූ විට අශ්වින්ගේ ප්‍රතිචාරය වූයේ ' අ ' ශබ්දය විවිධ ස්වරයෙන් පැවසීම පමණෙකි.

අසෝකා නැන්දාත් , පණ්ඩිත හාමුදුරුවෝත් කම්පනයට පත් ව මුහුණෙන් මුහුණ බලා ගත්තේ ඇසිල්ලකිනි. වෙනත් ප්‍රශ්න රැසක් විමසුව ද ඔහුගේ ප්‍රතිචාරය එය ම විය.

අවසානයේ ලොකු හාමුදුරුවෝත් අසෝකා නැන්දාත් මෙම දරුවා ව ඩිස්පෙන්සැරිය වෙත රැගෙන යාමට තීරණය කළහ.

" මේ දරුවා ඉන්නේ ගොළු - බිහිරි තත්වයේ අවදානම් ම මට්ටමක... බැලූ බැල්මට මේක කෑම බීම මදිකමකට ව ත් , හිතේ සාංකාවකට ව ත් ආපු වගක් පේන්ට නෑ... මේ දරුවා කුසේ ඉන්දැද්දී අම්මාගෙ වෙච්ච මොකක්හරි කායික හෝ මානසික වෙනසක් හින්දා , ඒක මේ දරුවාට බලපාපු වගක් දැනෙනවා..."

පියසේන දොස්තර මහත්මයාගේ මෙම වදන් පෙළ හමුවේ, අශ්වින් ව ත් කුසේ දරාගෙන ලක්ෂ්මිට විඳින්නට වූ දුක් ගැහැට කන්දරාව අසෝකාගේ සිහියට නැඟෙන්නට විණි.

" මේක සුව කොරන්ට බෙහෙතක් නම් නෑ පේන තෙක් මානෙක ... ඇමෙරිකාව වගේ රටවල බෙහෙත් තිබ්බට අපෙ රටවල් තා ම එච්චර දියුණු නෑ නෙ වැ... ඒ කාරණාවත් හිතට අරගෙන මේ දරුවට පුළුවන් තරම් හොඳට උගන්නන්ට බලන්ට..."

ලක්ෂ්මිගේ අවසන් වදන් හා දොස්තර මහතාගේ ප්‍රකාශය යන කාරණා දෙක ම සිතට ගෙන අසෝකා නැන්දා , අශ්වින්ට හොඳින් ඉගැන්වීමට ඉටා ගත්තේ ය.

******

ගමේ පාසලට අශ්වින් ව ඇතුළත් කිරීමට අසෝකා නැන්දා දැරුවේ සුළුපටු වෙහෙසක් නොවේ. තෙවන වරටත් එහි විදුහල්පති හමුවීමට යන්නට ඇය එදින සිතුවා ය.

" මං දැං වතාවකුත් කිව්වානෙ අසෝකා... මේ අඳ - ගොළු - බීරි ළමයෙක් මේ ඉස්කෝලේ හතර මායිමට වද්දගන්ට කැමැති නැතැ'යි කියලා... අනික ඔය බාගෙට දෙමළ කොලුවට උගන්නන්ට විසේස ගුරුවරුවත් , වෙනම වෙලාවක් ව ත් අපෙ ඉස්කෝලේ නැති වග... අසෝකා උනත් දන්නවානෙ, අසෝකාත් දෙක වසරෙ භාගයක් හරි වෙනකම් ඉගෙන ගත්තේ මේ ඉස්කෝලෙ ම නේ..."

අවසන් වදන් පෙළ විදුහල්පතිවරයා විසින් ඔච්චමට මෙන් අසෝකා නැන්දාගේ මුහුණට දමා ගැසුවේ ඇගේ නූගත් බව හා පහත් කුලය අවමානයට ලක් කිරීමේ අරමුණෙනි..තමාගේ මෙන් ම මේ කුඩා කොලු ගැටයාගේ අසරණ බව නිසා ම ඇය කඳුළු වගුරුවමින් බැගෑපත් වන්නට වූවා ය.

" අනේ මහත්තයෝ... බුදු බව අත්වෙයි මේ දරුවා ව මේ ඉස්කෝලෙට ගන්ට . මේ දරුවා ගොළුයි.. ටිකක් බිහිරියි තමයි... ඒත් දැහේ වරදක් නෑ...ඌ ඉගෙනගන්ටත් හරි දස්සයි මහත්තයෝ... බුදු බව අත්වෙයි මේ දරුවගේ නමත් ඔය පොතේ ලියා ගන්ට මහත්තයෝ..."

කියමින් අසෝකා නැන්දා, විදුහල්පතිතුමාගේ දෙපතුළ මත වැඳ වැටුණා ය.

" හ්ම්... අසෝකා මෙච්චර ට ම දොඩන එකේ මං ඔය යෝජනා ව සලකා බලන්නං..."

විදුහල්පතිතුමාගේ වදන් හමුවේ මීළඟට ඇගේ දෙනෙතින් කඩා වැටුණේ සතුටු කඳුළු කැට ය.

" මහත්තයා මතු බුදු වෙන්ට වටිනවා මහත්තයෝ ... මං දැන් ම ගොහිං කොලුවට ගල්ලෑල්ලකුයි, හුණු කූරු කීපෙකුයි අරන් දෙන්නං"

ප්‍රීතිය නිසාවෙන් ම කලබයට පත් ව සිටි අසෝකා නැන්දා ඉතා වේගයෙන් කාර්යාලයෙන් ඉවතට පිය මැන්නා ය.

* * * * * *

# 04

තමාට වඩා අවුරුදු දෙක තුනකට වැඩිමහල් සරත් අයියාගේ පැරණි සුදු කමිසයේත් , නිල් කලිසමේත් ආය කටු රැසක් ගසා අඩුපාඩු වැසෙන පරිදි අශ්වින් හැඳ පැළඳ ගත්තේ ය. අසෝකා නැන්දා ද තමා සතු අලුත් ම චීත්තයත්, හැට්ටයත් හැඳ අශ්වින්ගේ හිසකේ තම ඇඟිලි තුඩුවලින් සකස් කළා ය.

ශාස්ත්‍රකරුවන්ගෙන් අසා දැනගත් ශුභ මුහුර්තයන්ට අනුව, සමන්පිච්ච මල් දෙක තුනක් දැමූ වතුර වීදුරුවෙන් බිඳු කිහිපයක් අශ්වින්ට ඉස, දෙදෙනාම එළි බැස්සාහ.

ගමන අතරවාරයේ දී කඩමණ්ඩිය අසල අසෝකා නැන්දා මඳක් නතර වූයේ ගල්ලැල්ලක් හා හුණු කූරු කැබලි සහිත කුඩා පෙට්ටියක් අශ්වින් හට අරන් දීමට ය.පෙර දිනක දී ත් මෙලෙසින් ම ඇ සිතා සිටි නමුත් , අවැසි මුදල් නොමැති වූ නිසා එම කළමණා අරන් දීමට නොහැකි වූ බව ඇයට සිහිපත් විණි. කඩමණ්ඩියෙහි තිබූ උසස් ම වර්ගයෙන් ඇය ඒවා මිල දී ගෙන අශ්වින්ගේ දෝතට තිළිණ කළා ය. අශ්වින්ගේ පුංචි මුවෙහි වූ සිනා රැල්ල

දකින විට ඔහුගේ එක් කම්මුලක් ලක්ෂ්මීගේ මෙන් ම වළගැසෙන බවත් , සිරිසෝමගේ මෙන් ම තද කළු තියුණු ඇස් සිහින් වන බවත් ඈ දුටුවා ය.

කඩමණ්ඩියේ සිට පාසල දක්වා යන මඟ ඔවුන්ට මුණ ගැසුණු අය බොහෝ ය. ඔවුන් වගතුග විමසූ විට " කොල්ලා ව ඉස්කෝලෙ දාන්ට යනවා යැ"යි අසෝකා නැන්දා පැවසුවේ හද පිරී ඉතිරී යන අන්දමේ ඉමහත් සතුටකිනි.

ඒ පිළිතුර ඇසූවෝ අතරින් සමහරෙක් එය නිෂ්ඵල ක්‍රියාවක් බව සිතා සමච්චලයට මෙන් සිනාසුණු නමුත්, සමහර සානුකම්පිත සිත්වල ආශීර්වාදය ද අශ්වින් හට ලැබෙන්නට විය.

" මයෙ පුතා හොඳට ඉගෙනගනින් රත්තරනේ... කවුරුත් කියන කතාවලින් කාරි නෑ... පුළුවං උපරිමේට ම ඉගෙනගෙන උඹ වගේ අනිත් දරුවොන්ටත් උදව් පදවු කොරන්ට බලාහං මයෙ පුතේ..."

පාසලේ දී කුඩා දඬුවැට අභියස දී අසෝකා නැන්දා හැකි උපරිම ලෙස හඬ උස්කොට පැවසුවේ කුඩා අශ්වින් හට තරමක් දුරට හෝ ඇසෙන පරිදි ය. අශ්වින් හිස දෙපසට වැනුවේ ඇය පැවසූ දෙය තමා අවබෝධ කරගත් බව ඇඟවීමට ය. ඔහු පාසල තුළට යන තුරු ම අසෝකා නැන්දා කඳුළු පිරී රතු ව ගිය දෑසින් යුතු ව බලා උන්නා ය.

******

අශ්වින් වැලි මිදුල හරහා තමාට පෙනෙන්නට තිබූ මුල් ම කුඩා ගොඩනැඟිල්ල වෙත දිව ගියේ ය. ඔහු පන්තිය සොයා යන විටත් ගුරුතුමිය සිටියේ නම් ලකුණු කරමිනි. සන උපැස් යුවළක් ද පැළඳ කිසිඳු තෙතමනයකින් තොර බැල්මකින් ඇය පන්ති කාමරයේ දොර අභියස සිටි අශ්වින් වෙත දෙනෙත් යොමු කළා ය.

" පළවෙනි දවස හන්දා මේ පරක්කුවට සමාව දෙන්නේ... එන්න ඇතුළට දරුවෝ..."

කතාකිරීමට හා ඇසීමට අපහසුවක් පැවතිය ද, කාලයත් සමඟ අශ්වින් , අන් අය දත් හා දෙතොල් ඇතුළු මුව හසුරුවන ආකාරය අනුව ඔවුන් පවසන දෑ තේරුම් ගැනීමට පුරුදු වී සිටියේ ය. එම නිසා ඔහු සෙමෙන් බියපත් ලෙස ඇතුළට පිවිසියේ ය.

" මේ තමයි ඔයාලගෙ පංතියෙ අළුත් යාළුවා... මෙයාගේ නම තමයි... මොකද්ද... මේ.... අ... අශ්....."

අශ්වින් තම නම පැවසීමට උත්සාහහ කළද සුපුරුදු පරිදි මුවින් පිටවූයේ එකම ස්වරය පමණකි. තමා පිළිබඳව තමා තුළ ම උපන් අනුකම්පාව නිසා ඒ කුඩා දෙනෙත් රහසේම තෙත් වුණු බව ඔහුට දැනුණි . අසෝකා නැන්දා දුන් උපදෙස් නැවත නැවතත් ආවර්ජනය කරමින් ඔහු එය වළක්වා ගැනීමට උත්සාහ කළේ ය.

" ආ.... අශ්වින්..."

ගුරුතුමිය නාම ලේඛනය පරික්ෂා කොට පැවසූවා ය.

" හරි එහෙනම් , අන්න අතනින් වාඩිගන්ට..."

ගුරුතුමිය පන්ති කාමරේ පිටුපසම පේළියේ මුල්ලකම ඇසුරක් පෙන්වමින් පැවසුවා ය. එපරිද්දෙන් කුඩා අශ්වින් තම අසුන වෙත යාමට පන්තිය මැදින් ඇවිදදිමින් සිටිය දී, තම පන්තියේ අනෙක් ළමෝ එකිනෙකාගේ වැලමිටි වලට හොරෙන් ඇන ගනිමින් තමා දෙස ද ඇස් කොණෙන් බලමින් කිසියම් කසකුසුවක් නගන බව ඔහුගේ තියුණු දෙන්නට හසුවිණි.

අශ්වින් තමාට නියමිත අසුනේ හිඳගත්තේ ය. ළමෝ තමා දෙස වරින් වර හැරී බලන බවත් ඔහුට දැනුණි. ඒත් සමග ම ගුරුතුමිය සිංහල අක්ෂර මාලාව ඉගැන්වීමේ කටයුතු ආරම්භ කළා ය.

* * * * * *

" ඇත්ත ද නිමල් සර් අර අපෙ නිලූ ටීචගෙ පංතියට අලුතින් ළමයෙක් ඇවිත් ය කියන්නේ ? "

මුළු පාසලේ ම ඕපාදූප සොයන ගයන්ති ගුරුතුමිය එදින ම සවස ගුරු විවේකාගාරයේ දී නිමල් ගුරුතුමාගෙන් විමසුවේ ය.

" ඔව් ගයන්ති ටීච... අපෙ අසෝකා අර අරං හදාගත්ත ගොළු බිහිරි කොලු ගැටයලු ඔය... ඔහොම ළමයි ඉස්කෝලෙට වද්දගත්තහම අපෙ ඉස්කෝලෙට යන කලදසාව හිතන්ටකො... හරිහමං අම්මෙක් අප්පෙක් ව ත් ඉන්නවනං තව කමක් නෑ... "

" කතාව නං සහතික ඇත්ත සර්... ඒත් ඔය කොලුවා ඉගෙන ගන්ට හරි හපනා කියලා මට නිලූ ටීචර් කිව්වා... අත් අකුරු උනත් එක පාරක් කළුලෑල්ලෙ ලියලා පෙන්නුවා ම ඇතිලු... ආයෙ ගලේ කෙටුවා වගෙ ධාරණ සක්තිය... මතකෙන් ආපහු ඒ අකුර ඒ ආකාරෙට ම ලියනවා ලු..."

" ඔය යාන්තමෙන් අකුරක් දෙකක් ලියා ගත්තු පලියට හරි හපන්නු වෙනවා යැ ගයන්ති නඟා ... ඔය කොලුවා පහ වසරට එනකං වත් ඉගෙන ගත්තොත් ඕං මං ඉස්මුදුනෙන් පිළිගන්නවා ඌ ගජ හපනෙක් කියලා... අපෙ ලොකු සර්ටත් දෝදු ද මන්දා ඔය ආකාරෙ ළමයි ඉස්කෝලෙට වද්දගන්ට..."

මෙලෙස ටිකෙන් ටික අශ්වින් පිළිබඳ පුවත පාසල පුරා ම පැතිර යන්නට විය.

# 05

පහක් පමණ මෙලෙසින්ම ගතවී යන්නට විය. තම අධ්‍යයන කටයුතු අන් සියලු සිසුන් අභිබවා විශිෂ්ට මට්ටමක පවත්වා ගැනීමට අශ්වින් සමත් වූවේ ය. ඔහුගේ දක්ෂතා පිළිබඳ තොරතුරු මුළු පාසල පුරා මෙන්ම ගම පුරා ම ත් පැතිර යන්නට විය.

"සුභ උදෑසනක් වේවා සර්..."

පන්තිභාර ගුරුතුමිය පන්තියේ සිටිය දී ම විදුහල්පතිතුමා දැක ළමෝ සියලු දෙනා ම එක හඬින් පවසන්නට වූහ. ගුරුතුමිය ද තම අසුනින් නැගී සිටියේ එය සවනත වැකීමෙනි.

" සුභ උදෑසනක් වේවා ළමයිනේ..."

විදුහල්පතිතුමා පැවසියේ සුපුරුදු දැඩි ස්වරයෙන් තොර ව ය. වෙනදාට දැතෙහි වන වේවැල් මිටිය හා තුනී රීප්ප පටිය ද අද දක්නට නැත. ළමෝ නැවතත් බියෙන් මිදුණේ ඒ බව දැකීමෙනි.

" මං මේ අද ආවේ වැදගත් කාරණාවක් ගැන මේ දරුවෝ දැනුවත් කරලා යන්ට... හෙට උදේ, උදා රැස්වීමේ කතාව ඉදිරිපත් කරන්ට තියෙන්නේ..."

කතාව මදකට නවතා ඔහු තමා අත වූ නාම ලේඛනය වඩාත් විමසිලිමත් ව නිරීක්ෂණය කරන්නට වූවේ ය.

" අශ්වින් කියන පුතාට..."

තම නම විදුහල්පතිතුමාගේ මුවින් පිටවන බව දැකීමෙන් හා මදක් ශ්‍රවණය වීමෙන් ඔහු එකෙණෙහි ම සිට ගත්තේ ය. විදුහල්පතිතුමා ඔහු ව දකින විට ගුරුතුමිය කුමක් දෝ යමක් විදුහල්පතිතුමාට රහසින් පැවසුවා ය.

" හරි එහෙනං , ඒකට කාරි නෑ... අශ්වින්ට පුළුවන් වෙයි නේද අපේ සමන්ට ඉදිරිපත් කරන්ට කතාවක් හදලා දෙන්ට... සමන් ඒක ඉදිරිපත් කරයි..."

පැවසූ දෙය අවබෝධ වූ බව හැඟවීමට අශ්වින් හිස දෙපසට වැනුවේ ය. එපමණක් නො ව විදුහල්පතිතුමාත්, පන්තිභාර ගුරුතුමියත් පන්තියෙන් නික්ම ගිය පසු ඔහු යුහුසුළු ව තම වැඩහි නිරත වූවේ ය.

* * * * * *

***" සුභ උදෑසනක් වේවා ඔබ සියලු දෙනාටම... ලොකු සර්ගෙනුත්, මැඩම්ලගෙනුත්, සර්ලගෙනුත්, මගේ යාළුවො හැමෝගෙන්මත් අවසරයි... මම අද කතා කරන්ට යන්නේ මගේ රට ගැනයි...***

***මගේ රට පුංචි දූපතක්...ඒක ශ්‍රී ලංකාව කියලා හඳුන්වනවා...වෙන රටවල මිනිස්සු ඒකට ' ඉන්දියන් සාගරයේ මුතු ඇටය ' කියලා කියනවා . මගේ රට ඉන්දියන් සාගරයෙන් වට වෙලා තිබීමයි ඒකට හේතුව...***

*මගේ රට හරිම සරුසාර යි. මහගම සේකරයන්ගේ ' සරු පොළොවක් අපට ඇතේ ' වගේ කවිත්, සිංදුත් මගේ රට වෙනුවෙන් ලියැවුණේ ඒ හින්දම යි. සිරිපාද පද්මයෙන් පටන් ගන්න මහවැලි , කැලණි , කළු , වලවේගයක් වගේ ගංගා මගේ රටේ කෙත් වතු සරුසාර කරමින් ගලා යනවා... පිදුරුතලාගල කන්ද තමයි ශ්‍රී ලංකාවේ උස ම කන්ද... මහවැලි ගඟ තමයි දිග ම ගඟ... මගේ රට තුළ සරුසාර ගහවැල , කඳු පන්ති, ගංගා වගේ ම වනාන්තර රැසක් ම*

*දකින්න පුළුවනි ...*

*ඉතින් අපේ ජන්ම භූමිය කියන්නේ අපි හැමෝ'ම ලබන උරුමයක්... ඒකත් ශ්‍රී ලංකාව වගේ රටක ඉපදෙන එක , පෙර පිං මහිමයක් නිසා ම ලැබෙන දෙයක්. ඉතින් අපේ රට ආරක්ෂා කර කරගන්න එක අපි හැමෝ'ගෙ ම යුතුකමක් වගේ ම වගකීමක්...*

*අසා සිටි ඔබ සැමට ස්තුතියි !*

*මං පහේ පන්තියේ සමන් පද්මසිරි "*

අත්පොළසන් හඬ සැම තැනින් ම ඇසෙන්නට විය. එකල පහේ පන්තියේ දරුවකු ඉතා වුවමනාවෙන් මෙවැනි අරුත්බර කතාවක් තනි ව සකස් කර ගැනීම පවා මවිතය දනවන කරුණක් බව පාසලේ සිංහල ගුරුවරු පවා කල්පනා කළහ. සියලු දෙනා ම පුදුමයට පත් කළ කරුණ කියැවුණේ ඉන් අනතුරු ව ය .

*" මං මේ කතාව ඔයාලට ඉදිරිපත් කරාට, මේ කතාව මට හදලා දුන්නේ මගේ පන්තියේ ම අශ්වින් මුරමුදලි යාළුවා "*

සියලු දෙනා ම අශ්වයින් දෙස හැරී අත්පොළසන් හඬ නගන්නට වූහ. විදුහල්පතිතුමා පවා අත්පොළසන් දී, අශ්වින් ව වේදිකාවට කැඳවා අභ්‍යාස පොත් කිහිපයක් පවා තිළිණ කළේ ය.

******

" අසෝකා නැන්දෙ ... මං හදපු කතාවට හැමෝම අත්පුඩි ගැහුවා... ලොකු සර් තමයි මේ පොත් ටික තෑගි කළේ... "

ගෙදර දිව ආ වහාම නිල ඇඳුම ගලවා අව්වේ දමමින් ඔහු ගොළු බසින් පැවසුවේ ය. වසර ගණනක් ඔහු සමග ම හිඳ ඇයට ද දැන් එම බස තේරුම් ගැනීමට හැකි ය. ඇගේ ඇස් වල සතුටු කඳුළු රැඳෙන බව අශ්වීන් දුටුවේ ය.

"ඇත්තම ද මයෙ පුතේ , මයෙ පුතාට කව ම කවදාවත් වරදින්නේ නෑ... "

අශ්වීන්ගේ හිස අතගාමින් අසෝකා නැන්දා පැවසුවේ 'සිරිසෝමයි ලක්ෂ්මිත් උඹට කොහේ හරි ඉඳන් බලනවා ඇති ' යන සිතුවිල්ල සිතෙහි දරාගෙන ය.

අසෝකා නැන්දා මෙම සිදුවීම තම අසල්වැසියන් සමග පැවසීමට ද අමතක නොකළා ය.

******

දිනෙන් දින ශිෂ්‍යත්ව විභාගය ද ළඟාවන බව අශ්වින් සහසුදක්සෙන් ම දනී. අන් සැමදාටත් වඩා ඔහු වඩාත් උනන්දුවෙන් තම අධ්‍යයන කටයුතුවල යෙදුණේ ය. කිසිවෙකුට කරදරයක් නොවන පරිදි ඔහු ඉගෙන ගන්නට දරන උත්සාහය අගය කළ අය බොහෝ වූ නමුත් , ඊර්ෂ්‍යා කළ අය ද නොසිටියා නොවේ.

සැම දිනක ම මැදියම් රෑ වන තුරු ම ඔහු ඉගෙනුම් කටයුතුවල ඇලී ගැලී සිටියේ ය . ඔහු මේ සියල්ල සිදු කළේ කොළ අතු සෙවිලි කර තිබූ මැටි නිවසෙහි වූ කුප්පි ලාම්පුවෙහි එළියෙනි.

ශිෂ්‍යත්ව විභාගයට පැවැති අවසාන දින අසූව ද ගත වී ගියේ ඉගිලී මෙන් ය. ශිෂ්‍යත්වය සඳහා නියමිත දින උදාවිය. විභාගයට සාර්ථක ව මුහුණ දීමට ඔහු තුළ පැවතියේ මනා ආත්ම විශ්වාසයකි.

අන් සෑම දිනට ම වඩා ඔහු කලින් අවදි වූයේ ය.තවමත් සරත් අයියා හැඳ තමාට ලබා දෙන නිල ඇඳුම්වලින් , අඩු පාඩු අවම වූ සුදු කමිසයක් , නිල් කලිසමත් අශ්වින් ඇඟලා ගත්තේ ය. පාසලට ඔහු ව හාරදුන් මුල් දින මෙන් ම අසෝකා නැන්දා ද සමන් පිච්ච මල් කීපයක් දැමූ වීදුරුවකින් බිඳු කිහිපයක් අශ්වින්ට ඉස සුභ මොහොතින් දෙදෙනාම ගමන ආරම්භ කළහ. වැදූ මව නොවූ ව ද අශ්වින්ගේ හැදූ මව අසෝකා නැන්දා වූවා ය. මේ වන විටත් තම දරුවාගේ දක්ෂතා පිළිබඳ ඉමහත් ආඩම්බරයෙන් පසු වූ ඇය එදින සැරසී සිටියේ තම මවගෙන් උරුම වූ පැරණි විසිතුරු ඔසරියකිනි.

ගමේ පාසලේ ප්‍රමාණවත් පහසුකම් නොපැවති හෙයින් , ඔවුන්ට තම විභාග මධ්‍යස්ථානය ලෙස යාමට සිදුවූයේ නගරයේ සුප්‍රසිද්ධ විද්‍යාලයකට ය.

විභාග මධ්‍යස්ථානයට ඇතුළු වන්නට පෙර සිට ම කිසිවෙකු දෙස නොබැලීමට අශ්වින් සිතා ගත්තේ ය. ඒ ඔවුන් පවසන දේ තමාට පෙනුණහොත් , තමා නැවත නැවතත් මානසික ව බිඳ වැටේවි යැයි සිතීමෙනි.

අටට සීනුව නාද වූ වහා ම අන් සියලු දෙනාට ම මෙන් ම අශ්වින්ට ද තම ප්‍රශ්න පත්‍රය ලැබිණි. මොහොතක්වත් අපතේ නොයවා ඔහු විභාග අංකය ලියා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම ආරම්භ කළේ ය .

* * * * * *

# 06

ශිෂ්‍යත්ව විභාගයෙන් තෙමසක් ම ඔහේ ගතවිණි. සුපුරුදු පරිදි අනෙක් සිසුන්ගේ උසුළු විසුළුත් ,ගුරුවරුන්ගේ රැවුම් ගෙරවුම් ද ගණනකට නොගනිමින් අශ්වින් තම වැඩකටයුතු එලෙසින් ම පවත්වාගන්නට වූවේ ය. දිනෙන් දින දිනෙන් දින ගතවත් ම ඔහු තම ප්‍රතිඵල පිළිබඳ උත්සුක වූවේ ය. බලන බලන වාරයක් වාරයක් පාසා දැන්වීම් පුවරුවේ ඒ ගැන කිසිඳු සටහනක් නොවූ නිසා ඔහු ප්‍රතිඵල නිකුත් වන්නට කල්ගත වේ යැයි සිතා දැන්වීම් පුවරුව පිරික්සා බලන පුරුද්ද අත්හර දැමුවේ ය.

" ඇස් , කන් , නාසා, හොඳට තියෙන ළමයිත් පාස් නොවෙන එකේ මං වගේ බාගෙට බීරි , ගොළුවෙක් පාස් වෙයි යැ "

ඔහු ඒ අතරම සිතින් සිතුවේ ය.

සතියක් පමණ ඉතා සෙමෙන් ඔහේ ගතවිය. සතියක් වුව එය ඔහුට දැනුණේ කල්ප කාලාන්තරයක් ලෙසිනි.

එදින කුඩා අශ්වින් පාසල තුළට පිවිසෙත් ම පාසලේ එක ම කාලගෝට්ටියකි. දැන්වීම් පුවරුව අසළ ගැහැනු පිරිමි භේදයකින් තොර ව ළමුන් පොරකමින් සිටින බව ඔහු දුටුවේ ය. පියවරෙන් පියවර ඔහු ඒ වෙත ළඟා වූවේ ය.

කුතුහලය සිත තුළ පිරී තෙරපෙමින් තිබූ නමුත් , තමා ද අනුන් සමඟ පොරකන්නට වූ සිතිවිල්ල ඔහු ආයාසයෙන් මැඬගත්තේ ය. අනෙක් ළමෝ පිට ව යන තුරු ම ඔහු බලා සිටියේ ය.

අනෙක් ළමෝ හැරී යන විට තමා වෙත වෙනදා නොම වූ අන්දමේ සැලකිලිමත් බවක් දක්වන බව ඔහුට හැඟුණි. එය මිත්‍රත්වය දැනවීමක් ද , ගෞරවණීය බවක් ද , ආදරණීය හැඟීමක් ද , ඊර්ෂ්‍යා සහගත බවක් ද , වෛරී හැඟීමක් ද යන වග පිළිබඳ ඔහු තුළ නිශ්චිත අවබෝධයක් නොවුණි. ඔහු දැන්වීම් පුවරුව වෙත ළඟා වත් ම පාසලේ සීනුව නාද විය. සියල්ලෝ ඉදිරි මිදුලට දිව ගියහ

* * * * * *

ගාථා සජ්ඣායනා කොට උදෑසන කතාව ද අවසන් විණි . විදුහල්පතිතුමා රැස් ව සිටින්නන් ඉදිරියට පැමිණ සිටගත් විට කුමන හෝ ආකාරයේ ආරංචියක් ලැබී ඇති බව අශ්වින්ට දැනුණෙ ඉවෙන් මෙනි. පන්ති කාමරයේ දී මෙන් උදය රැස්වීමේ දී ඔහු අපහසුතාවයට පත් වූයේ නැත. ඒ උදය රැස්වීමේ දී සභාව අමතන සියලු දෙනා හඬ උස් කර කතා කරන බැවිනි . ඔහුට පැවතියේ සුළු ශ්‍රවණාබාධයක් නිසා ඔහුට ඒවා ඇසීමට හැකියාව තිබුණි.

" සුබ උදෑසනක් ඔය ළමයි හැමෝටම .... ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල ඇවිත් තියෙන වග ඔය ළමයි හැමෝම දන්නවා ඇතිනෙ මේ වෙනකොටත් "

අශ්වින්ගේ මුව විවර වුණි. දෑස් ද විවර වූයේ ඉබේටම ම ය. ඔහුගේ හදගැස්මේ වේගය කොතරම් යත් , ඔහුට සිතුණේ එය මුළු පාසලට ම ඇසෙනු ඇතැයි කියා ය.

" අපෙ ඉස්කෝලෙ සමත් ප්‍රතිශතය මේ ලියමනේ ආකාරෙට  සීයට දෙකයි... අපේ ඉස්කෝලෙන් ශිෂ්‍යත්වෙ ලියුවෙත් ළමයි පනස් දෙනෙක් ... ඒ අතරෙන් සමත් වෙලා තියෙන්නෙ එක ම එක ළමයයි... "

දැන සිටි නොසිටි සියලු දෙනා ම මුහුණෙන් මුහුණ බලා ගත්හ. ඒත් සමග ම විදුහල්පතිතුමාගේ බසට තව තවත් අවධානය යොමු කරන්නට වූහ.

" ඒ  සමත් වෙලා තියෙන්නෙත් මම , අපි , අපේ ගුරු මණ්ඩලය හීනෙකින්වත් නොහිතූ දරුවෙක්... ඒ තමයි අපේ අශ්වින් ... එම්. ඒ. අශ්වින් මුරමුදලි ... මුළු ලකුණු එකසිය අසූ අටක් ලබා ගනිමින් පුත්තලම දිස්ත්‍රික්කයත් ඇතුළු ව මුළු වයඹ පළාතෙන් ම තුන්වන ස්ථානයත් , මුළු ලංකාවෙන් ම පහළොස්වන ස්ථානයත් ලබාගන්න අශ්වින් සමත් වෙලා තියෙනවා... අපි හැමෝ ම සතුටු වෙන්න වගේ ම ආශිර්වාද කරන්නත් ඕන පුතාගේ ඉදිරි ගමනට... අශ්වින් පුතා අපෙ මුළු පාසලට ම ආඩම්බරයක් "

කියමින් විදුහල්පතිතුමා අශ්වින්ට ඉදිරියට ඇරයුම් කළේ ය. නිලූ ගුරුතුමියත් , ගයන්ති ගුරුතුමියත් , නිමල් ගුරුතුමා පවා ඒ වන විටත් සිටියේ පුදුමයෙන් මුව අයාගෙන ය .

උදෑසන සිට ම තමා වෙත ළමෝ විශේෂ සැලකිල්ලක් දක්වන්නටත් , ගුරුවරු වෙනදා නොවූ විරූ අවධානයක් යොමු කරන්නටත් හේතුව අශ්වින් හට අවබෝධ වූයේ එවිට ය . බොහෝ වේලාවක් විදුහල්පතිතුමා විසින් ඔහු ව අගය

කරමින් සිටිය ද , ඒ කිසිවක් පුංචි අශ්වින්ගේ දෙසවන වැකුණේ නැත. ඔහු ඒ වන විටත් සිටියේ තම සිහින ලෝකයේ වැජඹෙමිනි.

නැවතත් පියවි සිහියට පැමිණි විට ඔහු සිතිවිලි සයුරක කිමිදෙන්නට විය. ඇතැම් විට තමාට කතා කරන්නට හැකිවුණි නම් විදුහල්පතිතුමා තමා හට කතාවක් පැවැත්වීමට අවස්ථාවක් හිමිකර දෙනු ඇත. එවිට තම මියගිය දෙමාපියන් , අසෝකා නැන්දා , සරත් අයියා ගැනත් , තමා අන් අයගේ උසුළු විසුළුවලට බඳුන් වූ විට කියාගත නොහැකි වූ වේදනාබර හැඟීම්, තමා මේ තාක් දුරට විඳි දුක්ගැහැට පිළිබඳවත් සියලු දෙනාට ම පවසන්නට හැකිවන්නේ යැයි

ඔහු තනි ව සිතුවේ ය . ඒත් සමග ම , කුමන අඩුපාඩු පැවතියත් තමා ලද ජයග්‍රහණය පිළිබඳ සතුටට මෙන් ම නිහතමානී ආඩම්බරයකට ද පත්විණි. මව්පියන් වන සිරිසෝම හා ලක්ෂ්මිටත් , නිරතුරු ව තමාට ශක්තිය ලබාදෙමින් දෙවන අම්මා ලෙසින් රැකබලා ගත් අසෝකා නැන්දාටත් ඔහු සිතින් ස්තූති පූර්වක වූවේ ය. එකෙණෙහි ම තමා මේ තාක් විඳි දුක්ගැහැටවලින් හරි අඩක් පමණ අවසන් බවත් ඔහුගේ සිහියට නැඟුණි. තැගි රැසක් දෝතෙහි දරාගෙන ඔහු නැවත පන්ති කාමරයට ගියේ ඉහේ මලක් පිපුණාක් වැනි සතුටකිනි .

* * * * * *

තමා නිවසට එන විටත් අසෝකා නැන්දා සිටියේ සතුටු කඳුළු වගුරුවමිනි. තමා නිවසට ගොඩවන්නටත් පෙර විදුහල්පතිතුමා විසින් ඇයට ශුභාරංචිය පවසා තිබුණි. අශ්වින් නිවසට ඇතුළුවත් ම ඇය මුළුතැන්ගෙහි සිට ඇඳි චීත්තයෙන් අත පිසිමින් දොරකඩට පැමිණියා ය .

" මයෙ රත්තරං කොහොමහරි විභාගෙ සමත් උණා එහෙනං... දැන් උඹ විඳපු ගැහැටවලින් බාගෙට බාගයක් ම ඉවරයි. නගරෙ උඹට ගැළපෙන ඉස්කෝලෙකට ගියපුවහාම උඹට උසුළු විසුළු පාන්ට ඔය කවුරුත් එන්නෙ නෑ

නෙවැ... උඹෙ අනාගතේ උඹ දැනටමත් ලස්සන කරගෙන ඉවරයි කොලුවෝ..."

ඇය අශ්වින්ගේ හිස අතගාමින් තම සුපුරුදු සෙනෙහෙබර ස්වරයෙන් පැවසුවා ය. අශ්වින් ද සිටියේ ඇගේ සතුටු කඳුළින් තෙත් වූ නෙතු දෙස වරින් වර බලමින් තම නෙතු ද පොඟවාගනිමිනි.

" ඔහොම ඩිංගිත්තක් ඉඳහං පුතේ... දැං මුළු ගමේ ම ඇස්වහ කටවහ ඇත්තෙ මයෙ කොලුවට ... මං කැවුම් වගයක් හැදුවා... ඉස්සරෙල්ලා කැවුමෙ තෙල් ගාලා ඒවායිං උඹෙ ඇස්වහ කටවහ දුරිම්භූත කරලා ඉමු... "

පවසමින් ඇය මැටි බඳුනකට දමාගත් කැවුම් ගෙඩි කිහිපයක් ද ගෙන නැවත පැමිණියා ය. අශ්වින්ගේ වැලමිට සන්ධියෙහි සිට ඇඟිලි තුඩු දක්වාත් , දණිහේ සිට දෙපතුල දක්වාත් කැවුම් තෙල් ගාමින් , ඇය කුමක් දෝ කටපාඩම් කරගත් මන්ත්‍රයක් වැනි යමක් තොල් මතුරන්නට වූවා ය.

* * * * *

" නිමල් සර් දැන්වත් පිළිගන්නෙ ද මගෙ පංතියෙ අර දරුවා ගජ හපනෙක් කියලා... "

පසුදින ගුරු විවේකාගාරයේ දී නිලූ ගුරුතුමිය විසින් නිමල් ගුරුතුමාගෙන් විමසුවේ , පෙර දිනෙක ඔහු කළ ප්‍රකාශය මතක් කර දීමට ය . නිමල් ගුරුතුමා දැඩි ඇවතුම් පැවතුම්වලින් යුත් ඉතා නොහික්මුණු පුද්ගලයෙක් බව පාසල පමණක් නො ව මුළු ගම ම දන්නා කරුණෙකි . ඔහු තම සිසුන්ගේ අභ්‍යාස පොත්වල වැරදි නිවැරදි කරමින් සිටි නිසා නිලූ ගුරුතුමිය සමන්ති ගුරුතුමිය වෙත ඇසක් ඉඟිමරා විමසුවා ය.

" ඒක ඉතිං උගෙ පෙර පින... ඇස් , කන් , නාසා හොඳට තියෙන ළමයි පවා විභාගෙ ඇණගන්න කොට ඌ විතරක් පාස්වෙන්ට මොකෝ උට ගණපති නුවණ පහළ වෙලා යැ ... ඒකෙන් ම තේරෙනවා ඒක නිකම් ම නිකං උගෙ වාසනාවට වෙච්ච දෙයක් වග ... එහෙම නැතුව ඔය අශ්වින් කියන කොලුවා ඔය ඔක්කොලාම හිතං ඉන්න විදිහෙ සුපිරි වීරයෙක් වත් , මහා බහුශ්‍රැතයෙක් වත් නෙමෙයි "

නිමල් ගුරුතුමා එලෙසින් තම සිතෙහි වූ වයිරයත් , ක්‍රෝධයත් , ඊර්ෂ්‍යාවත් පිට කරන්නට වූවේ ය . දිගින් දිගට ම ගෙන ගිය මෙම සංවාදය , අසා සිටි අන් ගුරුවරුන්ට හාස්‍ය උපදවන්නක් බවට පත්විණි . ඔවුන්ගෙන් වැඩිමනක් මේ වන විටත් සිටියේ අතින් මුව වසාගෙන ය.

" අනේ ඇත්තමයි තමුන් උගන්නන ඉස්කෝලෙ ළමයෙක් ගොඩ එන්ට හදනකොට ආපහු ඇදලා වළට දාන්ට දඟලන හැටි... තමුන්ගෙ හිත පිරිසිදු කරගන්ට බැරි උනාට මොකෝ රට හදන්ට කතාව නං ... "

පාසලේ කාර්ය සහායක සේවකයෙකු වූ අදිරි පසෙකට වී තමා වෙත ම මුමුණා ගන්නට වූවේ ය.

* * * * * *

දින දෙක තුනකට පසු අසෝකා නැන්දා ළඟපාත ගමකට දරු ප්‍රසූතියට සහාය වන්නට ගොස් , මැදියම් රැයේ නැවත එනවිට අශ්වින් සිටියේ කුමක් හෝ අයදුම්පතක් කුප්පි ලාම්පු එළිය ආධාර කරගනිමින් පුරවමිනි .

" මොකක් ද මයෙ පුතේ මේ ? රුයේ , දවාලේ මෙන් හඬනඟා කතා කරන්නට නොහැකි වූ නිස අසෝකා නැන්දා ගොළුබසින් විමසන්නට වූවා ය .

" නැන්දෙ අද ලොකු සර් මේ අයදුම්පත්‍රෙ දුන්නා ඉස්කෝලෙ ඉවර උණ ගමං ... ගෙදර ඉවර කවුරුහරි වැඩිහිටියෙකුට කියලා පුරවාගන්නෙයි කියලා ... නැන්දා එන්ට පරක්කු වුණ හන්දා මං ඉතිං මේක පුරවලා දාන්ට පටන් ගත්තා... මේකෙ ලියන්ට ඕනෑ ,මගෙ නමයි , අම්මගෙයි තාත්තගෙයි නමුයි , භාරකරු කියලා තියෙන තිත් පේලියේ නැන්දාගෙ නමයි , මගෙ විභාග ලකුණයි , මං යන්ට කැමැති නගරෙ ඉස්කෝලෙ නමයි... මේ තියෙන්නෙ මගෙ ලකුණුවලට දාන්ට ඇහැකි ඉස්කෝල "

අයදුම්පත පෙන්වමින් ම ඔහු විශේෂ අවශ්‍යතා පාසලක් ලෙස සඳහන් ව තිබූ ප්‍රසිද්ධ පාසලක නම ඉදිරියෙහි වූ කොටුවේ '✓' ලකුණ යොදන්නට වූවේ ය . ඒ වන විටත් තමාගේ ශරීරාබාධ ගැන දැනුම්වත් ව සිටි ඔහු , එය තමාට ගත හැකි හොඳ ම තීරණය කියා සිතුවේ ය .

අක්ෂර ලිවීමේ හා කියවීමේ ශාස්ත්‍රය නොදත්ත ද , අසෝකා නැන්දා එම අයදුම්පත දෙස මඳ වේලාවක් බලා සිටියා ය.

" බලලා උඹට හොඳයි කියලා හිතෙන යමක් කොරන්ට මයෙ පුතේ "

අවසානයේ ඇය පැවසුවා ය.

* * * * * *

# 07

මාස හතරකට පමණ පසු ඔහුට තම අලුත් පාසල වෙත කැඳවීම් ලිපිය ලැබුණි. ඉහළ සාමාර්ථය නිසා ඔහුට සුළු මුදලක් , වාරයකට වරක් බැගින් පාසල් ගාස්තු හා අවශ්‍ය පොත්පත් , වාර්ෂික ව අවශ්‍ය නිල ඇඳුම් ආදිය ලබාගැනීම සඳහා එවකට රජය මගින් පවත්වාගෙන ගිය ' අත්වැල' ශිෂ්‍යාධාර ව්‍යාපෘතිය යටතේ අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබුණි.

මේ පාසලේ සිටියේ තමා වැනි ම ළමුන් පිරිසක් නිසා ඔහු ව මානසික ව බිඳ වට්ටන්නට උත්සාහ කරන්නට කිසිවෙකු සිටියේ නැත. කෙසේ නමුත් මෙම පාසලේ ද ඉගෙනුම් දක්ෂතා අතින් අභිබවා යන්නට කිසිවෙකු නොසිටි බව ඇත්තකි.

දෙසතියක් පමණ පාසලේ වටපිටාව නැරඹීමට හා ඒ සඳහා හැඩ ගැසෙන්නට ඔහු ගතකළේ ය . ඔහු ප්‍රාථමික අධ්‍යාපනය ලැබූ පාසලට වඩා මෙම පාසල ඔහුට සැබැවින් ම සුවදායී විය. එමෙන් ම එහි සිටි සියලු දෙනා තමා වෙත විශේෂ සැලකිල්ලක් හෝ විශේෂ කෙණෙහිළිකම් නොදැක්වූහ. එය ද ඔහුට නොමඳ අස්වැසිල්ලක් විය.

වාර විභාගවල සෑම විටම ඉතා ඉහළ ලකුණු ලබාගැනීමටත් අශ්වින් හය ශ්‍රේණියේ දී සමත් වූවේ ය . ඒ අතර ම දැල්පන්දු , එල්ලේ හා මේසපන්දු වැනි ක්‍රීඩා සඳහා ද ඔහු සහභාගී වූවේ ඉමහත් උනන්දුවෙනි . එල්ලේ කණ්ඩායමේ

අවුරුදු පහළොවෙන් පහළ ක්‍රීඩා නායකයා බවට පත්වන්නටත් ඔහු දෙමසක් ඇතුළත දී භාග්‍යය උදා කරගත්තේ ය.

* * * * * *

පුරා වසර හයක් විවිධ සතුටුදායක සිදුවීම් හා අපහසුතා මධ්‍යයේ ගත වී තිබුණි . ඒ වන විටත් ලැබිය හැකි උපරිම සාමාර්ථ ලබා සිටි ඔහු , සමස්ත ලංකා අටවන ස්ථානය ලබා ගනිමින් පාසලට අභිමානයක් ගෙන දෙන්නට කටයුතු කර තිබුණි. එල්ලේ කණ්ඩායමේ ක්‍රීඩා නායක තනතුරත් , පාසලේ උප ප්‍රධාන ශිෂ්‍ය නායක ධූරය හෙබවීමටත් ඔහු ඒ වන විට සමත් ව සිටියේ ය.

අශ්වින් තම උසස් පෙළ විෂය ධාරාවන් ලෙස කලා විෂය ධාරාවෙහි සමාජ විද්‍යාව , බුද්ධ ධර්මය , සිංහල භාෂාව හා සාහිත්‍යය යන විෂයයන් තෝරා ගැනීමට තීරණය කළේ ය. ඒ හුදෙක් විද්‍යා හෝ ගණිත විෂයයන් තෝරාගෙන උසස් සාමාර්ථ ලබා ගැනීම සඳහා ඔහු තුළ වූ අපහසුවක් නිසා නොවේ.

කලා විෂය ධාරාවෙන් උසස් සාමාර්ථ ලබා ගතහොත්, රජයේ විශ්ව විද්‍යාලයකින් වැඩිදුර අධ්‍යාපනය හදාරා , ගුරු ක්ෂේත්‍රයට පිවිස එමඟින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළට ම ගොස් තමා වැනි ම දුක්පීඩා විඳින දරුවන් ව ද ඇතුළු ව සියලු ම දරුවන්ට සේවය කිරීමට ඔහුට අවැසි විය . දරුවන්ට ජීවිතයේ හමුවන අභියෝග මැඩගෙන ඉදිරියට යන අන්දම කියාදීම ඔහුගේ මූලික අරමුණ විය.

උසස් පෙළ විභාගයට ද ඔහු පුරුදු පරිදි ම මනා ආත්ම විශ්වාසයකින් යුක්ත ව ඇප කැප වී පුරා වසර දෙකක් පමණ ඔහු කටයුතු කළේ ය.කොතරම් කාර්යබහුල වුව ද , දෙසතියකට වරක් අසෝකා නැන්දා ව බලන්නට යාමට ඔහු අමතක නොකළේ ය. ශිෂ්‍යාධාර මඟින් තමා හට මාසික ව ලැබෙන සුළු මුදලින්,  නැන්දා ව බලන්නට යන වාරයක් වාරයක් පාසා චීත්තයක් , හැට්ට රෙද්දක් , නගරයේ රසබර කෑම වර්ග කිහිපයක් රැගෙන යාමට ද ඔහු අමතක නොකළේ ය.

" මට මේ ජාති උස්සාන එන්ට බැරි උනාට කාරි නෑ මයෙ පුතේ... ඉස්සරෙල්ලා උඹ හොඳට ඉගෙනගනිංකෝ... උඹ අපෙ මේ ගමේ අපිට ඇණුම් පද ගොතාපු එවුන් සේරෝටම පේන්ට උපාධි පිට උපාධි අරං ලොකු මහත්තයෙක් වෙනවා මගෙ ඇස් පියවෙන්ට කලින් මට බලාගන්ට තිබ්බනං ... මට ඒ ඇති... "

සෑම විට ම අසෝකා නැන්දා එලෙසින් සෙනෙහෙබර ව පවසන්නට වූවා ය. කුඩා කල සිට ම තමාට මවක මෙන් ම පියෙකු ලෙස ද හදා වඩා ඇති දැඩි කළ ඇයට , මෙවන් කුඩා දෙයක් වත් ගෙනැවිත් දෙන්නට නොහැකි නම් තමාගෙන් ඇති ඵලය කුමක් දැයි එවිට ඔහු සිතන්නේ ය.

" මං හොඳට ඉගෙනගෙන , හොඳ රස්සාවක් කරලා , නැන්දාවත් මගෙ ඇස් දෙක වගේ බලාගන්නං නැන්දෙ "

ඔහු නිවසින් එන සෑමවිට ම ආපසු පාසල වෙත යන්නේ එලෙස අධිෂ්ඨාන කරගෙන ය.

* * * * * *

# 08

උසස් පෙළ ප්‍රතිඵල ද නිකුත් විණි. එහි ප්‍රතිඵල පිළිබඳ ව නම් ඔහු තුළ සැකයක්, අවිනිශ්චිත බවක් තිබුණේ ම නැති තරම් ය . විශිෂ්ට සාමාර්ථ තුනක් සහිත ව ඔහු ඉතා උසස් ලෙස එම කඩයිම ද සමත් වී තිබුණි. විශ්ව විද්‍යාල පාඨමාලා ප්‍රවේශය සඳහා අයදුම්පතක් ද කලාප අධ්‍යාපන කාර්යාලයෙන් එදින ම ලබාගත් ඔහු එය ද රැගෙන කෙළින් ම ගියේ පාසල් නේවාසිකාගාරයට ය. හැකි ඉක්මණින් තම බඩු බාහිරාදිය රැගත් මල්ල ඔහු අසුරා ගත්තේ ය. මේ තමා පාසලේ සිටින අවසාන දිනය බවට ඔහුට ඒත් සමඟ ම සිහිපත් වුණි.

බස් නැවතුම වෙත ගමන ඉක්මන් කර ගිය ඔහු කොළඹ - පුත්තලම බස් රියකට නැඟුණේ ය. දිනයේ අධික වේලාවක් පාඩම් කටයුතු වෙනුවෙන් ම වෙහෙසුණු ඔහුගේ දෑස් පියැවුණේ ඉබේට ම ය .

* * * * * *

තමා නිවසට පා තබන විට ම කිසියම් මැර කල්ලියක් වැනි පිරිසක් පැමිණ, අසෝකා  නැන්දා ව බලෙන් රැගෙන යාමට උත්සාහ කළහ. අශ්වින් සිටියේ කිසිවක් කරකියා ගත නොහැකි මට්ටමේ තත්වයක ය.

" මට උඹත් එක්ක ඉන්ට තිබ්බ කාලෙ අහවර වෙලා මයෙ පුතේ... මං නැහැයි කියලා උඹ වැටෙන්ට එපා .... ඇහැට කනට පේන්ට නොහිටියත් මං උඹත් එක්ක හැමදාම ඉන්නවා ... උඹ හොඳට ඉගෙනගෙන ජීවිතේ උපරිම තැනකට ඇවිත් හොඳ මහත්තයෙක් වෙලා ජීවත් වෙන්ට බලහං රත්තරං ... ලබන ආත්මෙත් මනුස්ස ජම්මයක් ලැබුවොත් මගෙ ම පුතෙක් වෙලාඉපදියං මයෙ පුතේ..."

ඇය පැවසුවේ එපමණෙකි. ඒත් සමග ම ඇයත් , ඇය ව බලහත්කාරයෙන් කැඳවාගෙන යන්නට ආ කල්ලියත් නොපෙනී ගියහ.

සිරුර පුරා දහදියෙන් තෙත් ව ගොස් අශ්වින් තිගැස්සී අවදි වූයේ මාර්ග තදබදය නිසා නැඟුණු තිරිංග හඬ නිසාවෙනි.

" අනේ අම්මපා මෙහෙව් හීනයක් නම් උපන් දා ඉදං දැක්කමයි... මගෙ අසෝකා නැන්දාව මගෙන් ඇත් කරන්ඩ පුළුවන් ජගතා කවුද මේ ලෝකෙ ඉන්න ... මේ ලෝකෙ කොහෙ හංගලා තිබ්බත් මං නැන්දා ව හොයාගන්නවා...

මේ මනස්ගාත හන්දා ඇඟ පුරා දාඩිය දාලා කමිසෙත් තෙත් වෙලා ... නැන්දා දැනටමත් මං ආසා කළුපොල් මාළුවයි , පොළොස් ඇඹුලකුයි උයනවා ඇති..."

ඔහු නැවතත් සිතින් සිතුවේ ය. නමුත් දුටු සිහිනය පිළිබඳ යම් චකිතයක්, දෙගිඩියාවක් ඔහුගේ සිත තුළ බල පවත්වන්නට වූවේ ය .

* * * * * * *

අශ්වින් පුත්තලම දක්වා පැය පහක විඩාබර ගමනකින් ද , පුත්තලමේ සිට වනාතවිල්ලුව දක්වා පැය තුන්කාලක පමණ දුෂ්කර ගමනකින් ද පසු , පටු වැලිපාර ඔස්සේ ගමන් කොට ඔහු ගෙපැල වෙත සේන්දු වූවේ ය.

ඔහු නිවසට එන විටත් දඬුවැට අසළ සිට නිවස දක්වාත් , මුළු නිවස පුරාවටමත් මහා සෙනඟකි. පෙර කිසි දින දැක නැති අසල්වැසි ගම්වාසීන් පවා එහි වූහ. ඔහු මුලින් සිතන්නට වූයේ කුමක් හෝ දානමානාදී පිංකමක් කියා ය. නමුත් ගේ අවටත් ගේ සිට සොහොන දක්වාත් තැනින් තැන සුදු කොඩි සිටුවන විට ඔහු තුළ පැන නැඟුණේ සැකයකි . ඒත් සමඟ ම නිවස ඉදිරිපිට ම ' අනිච්චාවත සංඛාරා ' ලෙස ලියා තිබූ පාලම් කොඩිය දකින විට ඔහුගේ ඇස් නිලංකාර වන්නාක් මෙන් ඔහුට දැනුණි.

අශ්වින් පැමිණ සිටින ආරංචිය ලද වහා ම , එදා මෙදා තුර තමාට අතහිත දුන් එක ම මිතුරා , එනම් සරත් අයියා ගෙතුළ සිට ඉවතට දිව ආවේ ය .

" අනේ බලාපංකෝ කොල්ලෝ... උඹලගෙ ඉස්කෝලෙ ඉන්න අපි අඳුරන මහත්තුරු කී දෙනෙක්ට මං ටවුමට ගොහිං ටෙලිපෝං කරා ද ... ඒ මහත්තුරු අපිට කිව්වා උඹ ඒ වෙනකොටත් ඉස්කෝලෙන් පිටත් වෙච්ච වගක්... අනේ මේ බලාහං අශ්වින් මල්ලියේ ....නැන්දා අපි ව දාලා ගොහිං... යන්ට ම ගොහිං .... ආයෙ නොඑන්ඩ ම ගොහිං මල්ලියේ..."

අවසන් වදන් පෙළ කියවෙත් ම අශ්වින්ට තමාගේ මුළු ලෝකය ම කැඩී බිඳී සුණු විසුණු වන්නාක් මෙන් දැනුණි. තමා බස් රථයට නඟින්නට පෙර ම කුමන හෝ අවස්ථාවක වාහනයක ගැටී , මැරී වැටුණේනම් මීට වඩා හොඳ යැයි ඔහුට සිතුණි. ඔහු තරමට ම අසෝකා නැන්දාට ළෙංගතු ව සිටි සරත් අයියා ද අශ්වින් ව බදාගෙන නොනවත්වා ම හඬන්නට වූවේ ය .

අශ්වින් වහා දිව ගියේ ගෙතුළට ය. අසෝකා නැන්දා සුදු ඔසරියකින් සැරසී නිසල ව ලී පෙට්ටියක් මත වැතිර සිටීම අශ්වින්ට ඉහිලුම් නොදුණි. තමා පැයකට පෙර පැමිණියේ නම් නැන්දා ව බේරා ගන්නට හැකියාව තිබූ බව සරත් අයියා පැවසීමත් සමග , ඔහුගේ වේදනාව තව තවත් තීව්‍ර කිරීමට

හේතු විණි. තමාට පැවසීමට හැකි ව තිබූ එක ම ස්වරය ද හැකි උපරිම හඬනඟා පැවසීමට ඔහු වෑයම් කළේ ය. එවිට නැන්දා පුරුදු පරිදි තමාට කතා කරාවී යැයි ඔහු සිතුවේ ය . ඒ තරමට ම නැන්දා තවමත් ජීවතුන් අතර සිටින බවට ඔහු විශ්වාස කළේ ය.
ඔහු වරෙක හඬන්නටත් , වරෙක ඉකිබිඳින්නටත්, වරෙක කල්පනාවෙ ගිලෙන්නටත් වූවේ ය.

මැදියම් රැය වන විට ගෙතුළ ඉතිරි වූයේ වැඩිහිටි පිරිමින් හත් අට දෙනෙකුත් , හෙට දින මළගමට ආහාර පිසීමට රැඳී සිටි අසෝකා නැන්දාගේ මිතුරු වින්නඹු මාතාවන් කිහිප දෙනෙකුත් , සරත් අයියාත් පමණි.

තමාගේ ගොළු - බිහිරි බව දැනගත් මුල් ම දිනයේ තමාට පැවති අප්‍රමාණ සෙනෙහස නිසා ම , කලබලයට පත් වූ හැටි , වයිද්‍යා ශාලාවට තමා ව වඩාගෙන ගිය හැටිත් , තමා ව පාසලට ඇතුළත් කරගන්නා ලෙස විදුහල්පතිතුමාගේ දෙපතුළ අල්ලා වැඳවැටී ආයාචනා කළ සැටිත්, තමා ශිෂ්‍යත්වයට පාඩම් කරන විට නිදිමරමින් පත්තර පිටු දෙක තුනකින් පවන් සැලූ සැටි , තමා ව දිරිගැන්වූ සැටි , ප්‍රතිඵල අසා සතුටු කඳුළු වැගිර වූ සැටි පිළිබඳ මතකයන් ඔහුගේ සිත තුළ සක්මන් කරන්නට විය . එමෙන් ම සතියකට දෙතුන් වතාවක් තම අදහස් සරත් අයියා ලවා ලියවා ඔහුගේ සුවදුක් විමසූ සැටි , තමා දෙසතියකට වරක් ඇය ව බලන්නට එන විට ඇයගේ මුහුණේ වූ ළෙංගතු හා ආදරණීය සිනහවත් ඔහු ඉදිරියේ මැවි මැවි දිස්වන්නට විය.

" මා ව උස්මහත් කරන්න නැන්දා විඳපු දුක මට අමතක නෑ නැන්දෙ... අම්මගෙවත් තාත්තගෙවත් අඩුපාඩුවවත් , වටේ පිටේ උන්නු එවුන්ගේ සමච්චලයවත් නැන්දා මට දැනෙන්ට ඇරියෙ නෑ... ඒත් නැන්දෙ... ඇයි නැන්දෙ මා ව මගින් මෙහෙම දාලා යන්නෙ ... මං හැමදාම ලොකු මහත්තයෙක් වෙන්ට ආසා කළේ මං වගේ තව ළමයින්ට උදවු කරන්න වගේ ම , නැන්දා ව රැජිණක් වගේ බලාගන්න... නැන්දාට ඕනෙනං තිබ්බා ඒ කාලෙම මාව බල්ලෙක් බළල්ලෙක් වගේ පාරෙ අතෑරලා දාලා යන්ට...පුංචි කාලෙ ඉඳං මගෙ ලෝකෙ එළිය වුණේ නැන්දා.... නැන්දාගෙ ආසාව මම කොහොමහරි ඉටු කරනවා නැන්දෙ... ඒත් නැන්දාගෙ අඩුව පුරවන්ට කාටවත් බෑ.... නැන්දා වගේ මා ව බලාගන්ට , මට ආදරේ කරන්ඩ , මට අම්මා කෙනෙක් වෙන්ට කෙනෙක් ලැබුණෙ මං ජාති ජාති

කරපු පිනකට... ඒත් නැන්දා නැතුව මට දැනෙන වේදනාව වත් මට කාටවත් කියාගන්ට බෑ නැන්දෙ... ඒ තරමට අසරණයි මං "

අශ්වින් රථය එළිවන තුරු ම සිතින් සිතමින් , හිසේ අත ගසාගෙන , නිහඬව ම කඳුළු හෙළන්නට වූවේ ය. රැඳී සිටි අනෙක් කාන්තාවෝ ද චීත්තයේ නෙරියේ කොණකින් නෙතඟ රැඳි කඳුළු පිසින්නට වූහ.

* * * * * *

අසෝකා නැන්දාගේ මෙලොව හැරයාමෙන් සත් දිනක් ම එලෙසින් ගෙවී ගොසිනි. අශ්වින්ගේ දෙනෙත් රතු වී ඇස් වටා කළු වී ගොස් තිබූ අන්දම , තව දුරටත් හඬන්නට කඳුළු නැති බව හැඟවීමට මනා සාක්ෂි විය. කුසට ද හරිහමන් අහරක් නැත. සරත් අයියා විසින් ඔහුට බලෙන් ම දිනකට කවන බත් කටවල් හතර පහ තුළින් පමණක් ඔහු කුස පුරවා ගත්තේ ය.

අසෝකා නැන්දාගේ මිහිදන් කිරීමේ කටයුතු ද පවත්වා තිබුණි. අශ්වින් කනත්ත වෙත පවා නොගියේ අසෝකා නැන්දාගේ සිරුර මතට පස් පිඩැල්ලක් පවා දැමීමට තරම් ඔහුගේ සිත ශක්තිමත් ව නොතිබූ බැවිනි. ඔහු ගෙයි මුල්ලකට වී කල්පනා කරමින් සිටියේ ය.

අසෝකා නැන්දාගේ සත් දින පිංකම ද එළඹී තිබුණි. පිංකම් කටයුත්තෙහි සියලු සංවිධාන කටයුතු මෙහෙය වූයේ සරත් අයියා විසිනි . රාත්‍රියේ බණට වැඩි පණ්ඩිත හාමුදුරුවෝ අනිත්‍යතාව පෙන්වා දෙමින් පැය එකහමාරක පමණ සද්ධර්ම දේශනයක් පැවැත් වූ නමුත් ඒ කිසිවක් අශ්වින්ගේ සවනට නම් වැකුණේ නැත. ඔහු තවමත් නිසොල්මන් ය.

දානමය පිංකමෙන් පසු පැන් වත් කරන්නට සියලු දෙනා එක්වූහ. කෝප්පයේ ජලය පිරී ඉතිරී පිරිසිය වෙත කාන්දු වන විට " මං ගොහිං එන්නම් පුතේ " යැයි අසෝකා නැන්දා කොහේ හෝ සිට පවසන්නාක් මෙන් ඔහුට ඇසිණි. ඔහු

පිංකම මධ්‍යයේ දී ම නැඟිට ගියේ ඉකිබිඳුම නවත්වා ගන්නට නොහැකි වූ කල්හි ය .

* * * * * *

තෙමසක් ගත වී යන්නට විය. සිතෙහි දුකත්, පාළුවත් පැවති නමුත් ඔහු ටිකෙන් ටික පියවි සිහියට පැමිණියේ ය. ඒ අතරතුර කාලයේ දී ම ඔහු විසින් අයදුම් කර තිබූ කැළණි විශ්ව විද්‍යාලයේ , කලා අංශයේ විශේෂ අවශ්‍යතා අංශය වෙත ඇතුළත් වන්නට භාග්‍යමත් වූවේ ය. කෙසේ වුව ද පසුගිය මාස කිහිපයේ දී ම වූ සිදුවීම් නිසාවෙන් , ඔහුට එම ආරංචියෙන් විශේෂ සතුටකවත් , දුකකට වත් පත් නොවූ තරම් ය. සියල්ල දෙස මැදහත් සිතින් උපේක්ෂා සහගත ව බැලීමට ඔහු හුරුවෙමින් සිටියේ ය. නමුත් අසෝකා නැන්දාගේ සිහිනය මල්ඵල ගැන්වීමට විශ්ව විද්‍යාල අධ්‍යාපනය මැනැවින් හදාරා , ගුරු වූර්තියට බැඳී තමා වැනි ම වූ තවත් ළමුන්ට උපකාර කිරීමට ඔහු ඉටා ගත්තේ ය

* * * * * *

# 09

අශ්විත්ගේ දිනපොතේ අවසාන පිටු කිහිපයත් කියවා අවසන් කළ යශෝධා අතුකෝරාළ මෙනෙවිය කඳුළු වැගිරෙන දෑසින් යුතු ව පියවි සිහියට පැමිණියා ය . ඒ වන විටත් ඇය සුගුණපාල වෙත දන්වා ලබාගත් කෝපි වීදුරුව ඇල්මැරී ගොස් තිබුණි. හඬමින් වුව ඇය ඔහුගේ දිනපොතෙහි අවසන් පිටුව පෙරළුවා ය.

" ***1993 ජූනි 03 - ඉරිදා***

***හෙට තමා මගෙ ජීවිතේ සතුටුදායක ම දවස... 05 ශිෂ්‍යත්වය , සාමාන්‍ය පෙළ උසස් පෙළ වගේ මං අමාරුවෙන් ජයගත්තු කඩයිම්වලටත් , විශ්ව විද්‍යාලයෙන් ගත්තු උපාධියටත් ඒ නියමිත වටිනාකම ලැබෙන දවස ... හෙට තමයි මට රජයේ නිර්දේශිත ගුරුවරයෙක් විදිහට පත්වීම ලැබෙන දවස... කෙළෙහිගුණ තියෙන මනුස්සයෙක් විදිහට , මොන දුෂ්කරතා තිබුණත් අම්මාටයි , තාත්තාටයි , දෙවැනි අම්මා වුණු අසෝකා නැන්දාටයි මගෙන් වෙන්න ඕන යුතුකම් ඉටු කරන්න ඕනෑ ... නැන්දාත් මමත් අවුරුදු***

*ගණනාවක් තිස්සේ දැකපු හීන හැබෑ වෙන්නෙ එතකොට ... ඒ වෙනුවෙන් මට කරන්න පුළුවන් හැමදේම මම කරනවා "*

එහි සඳහන් ව පැවතියේ එපමණෙකි . ඉතිරි පිටු සියල්ල හිස් ය. ඔහු තමා ව මුණ නොගැසුණේ නම් ඉතිරි පිටු සියල්ල ද ඔහුගේ ධනාත්මක සිතුවිලිවලින් පිරී යන බව ඇයට හැඟුණු අතර , ඇය කිසිදා නොවූ පරිදි ඉකිබිඳිමින් හැඬුවා ය.

ඒත් සමග ම සතුෂ්මි කිසියම් රාජකාරීමය කටයුත්තක් සඳහා සඳළුතලය වෙත පැමිණියා ය.

" Sorry for disturbing madam.... May I come in ? "

" Yes dear "

ඇය කඳුළු පිසදමමින් නැවත ප්‍රකූර්ති තත්වයට පැමිණෙන්නට වෙර දරමින් පැවසුවා ය. ඇගේ අත වූ පොතත්, තද රෝස පැහැයට හැරී ඉදිමී ගොස් තිබූ ඇගේ මුහුණත් දැක සතුෂ්මිට තමා පැමිණි කාරණය මඳකට අමතක විය.

" Madam if you don't mind ... can I please know this book belongs to whom ? "

" මේ පොත අද අපි මල් තියලා ආපු සර්ගේ diary එක සතුෂ්මි "

" මැඩම් ගිය පාර vacation වලට ගිහින් හිටපු කාලෙ මං මේ පොත දැක්කා මැඩම්ගේ bookshelf එකේ... මැඩම් මට ඒකෙන් කැමැති පොත් අරගෙන කියවන්න අවසර දීලා තියෙන නිසා මමත් ඔය පොත කියෙව්වා... එයා ගොඩක් ආදර්ශමත් කෙනෙක් බව ජේනවා.... ඒ diary එක print කරලා free බෙදලා දුන්නත් ගොඩක් helpful වෙයි... ඒත් ඒ පොතේ අන්තිම පිටු හිස් වුණේ ඇයි මැඩම් ? එය කොහොම ද මැඩම්ට සම්බන්ධ වුණේ ? What happened to him ? "

සතුෂ්මි තම සිතෙහි වූ සැක සහිත වූ තැන් සියල්ල එසේ යුහුසුළු ව විමසන්නට වූවා ය.

" Sit here "

බංකුවේ එහා කොණ පෙන්වමින් , අහස දෙසම බලාගෙන යශෝධා මෙනෙවිය කතාව පැවසීම ඇරඹුවා ය .

# 10

---

" එදා 1993 ජුනි 04 ...මම හිටියේ O/ L වලට මැත්ස් ක්ලාස් යන ගමන්... ඇක්සිඩන්ට් එකෙන් පස්සෙ මං හැදුණෙ වැඩුණෙ හොස්ටල් එකේ වුණත් , මට ඕන තරමට සල්ලි තිබුණෙ නෑ... මට ඒ වෙන කොටත් තිබ්බ ශ්‍රවණාබාධෙ නිසා ක්ලාස්වල කියලා දුන්න දේවල් වුණත් මට නොතේරුණු තරම්... ඒත් ඒ දේවල් අහගන්න කෙනෙක් වත් කරගන්න දෙයක් වත් නොතිබ්බ හන්දා ඒ ඉතිරි මාස හයත් ක්ලාස් යන්න මං තීරණය කරලා තිබුණා ...

කොහොමහරි මං එදා බස් එකට නැග්ගා ක්ලාස් එකට යන්න... කලම්බෝවල කොහොමත් ඉතින් උදේ අටෙන් පස්සේ කොච්චර බස් තිබ්බත් ඒ දවස්වල සෙනඟ...මං නැඟපු බස් එකෙත් එදා පුදුම සෙනඟක් හිටියේ... ටික වෙලාවකින් බස් එකට ටිකට් ගන්න කියපු එක මට නෑහුණු නිසා බස් එකේ conductor මට බැන්නේ මං හොරට යන්න හදනවා ය කියලා... ඒක මට තේරුණා.... කොහොමහරි බස් එකේ දොර ගා ව ම වාගෙ ඉඳන් හිටපු කඩවසම් මහත්තයෙක් මට කතා කරලා එයාගෙ ශීට් එක මට දුන්නා.... එයා කතා කරපු විදිහෙන් ම මට තේරුණා එයා ගොළු කෙනෙක් වග... සුදු කමිසයයි , කළු කලිසමයි , හොඳට පොලිෂ් කරලා තිබුණ shoes දකිද්දි ඕන කෙනෙකුට කියන්න පුළුවන් එයාගෙ neat එක ගැන... මටත් හරියට කන් ඇහුණෙ නැති නිසා මට ඒ වෙනකොටත් හස්ත මුද්‍රාවලින් කතා කරන ගොළු භාෂාව හොඳට

පුළුවන් වෙලා තිබුණෙ... මං තීරණය කළා එයත් එක්ක කතා කරන්න... So we started to speak in our way... "

" කොහෙ ද මේ දුව අද යන්නෙ ? "

" සර් මං මේ අවුරුද්දේ O/L කරනවා... ඒවාට maths revision class යන ගමන් ..."

කඩවසම් ව පෙනුණත් , මට දුව කියල කතා කරපු හන්දායි, වැදගත් පෙනුමයි නිසා මම එයාට සර් කියලා කතා කරා ..

" මට උපන් දා ඉඳලා කතා කරන්න බෑ.... කන් ඇහෙන්නෙත් අඩුවෙන් ... ඒකට දැන් කරන්න දෙයක් නෑ කල් වැඩි ලු... දුවගේ කන්වල මොකක්හරි ආබාධයක් තියෙනවා වගේ මං දැක්කා .."

මටත් එක්ක ටිකට් ගන්න ගමන් එයා ඇහුවා.

" මට අවුරුදු 07 දී accident එකක් වුණා සර්... ඒකෙන් අම්මයි, තාත්තයි , අම්මගේ බඩේ හිටපු මල්ලියි නැති වුණා... මටත් පොඩි ශ්‍රවණාබාධයක් තියෙනවා ඒකෙ අතුරු ප්‍රතිඵලයක් විදිහට .... "

" දුවගෙ කතාවත් මගෙ වගේ ම නේ "

කියන ගමන් බස් ස්ටෑන්ඩ් එකට ආපු නිසා අපි දෙන්නා කතා කරන ගමන් ම බස් එකෙන් බැස්සා.

" දුවට යන්න හදිස්සි ද ? "

" නෑ සර් "

" එහෙනම් මට පැය භාගයක් දෙන්න...මට පුළුවන් වෙයි දුවට උදවුවක් කරලා දෙන්න.. "

කියන ගමන් සර් මා ව එක්කන් ගියා අපෙ ක්ලාස් එකට යන පාරෙ තිබුණු ශ්‍රවණාධාරක හදන තැනකට... ඒ දවස්වල මට මේ දේවල් ගැන ලොකු අවබෝධයක් තිබුණෙ නෑ... කොහොමහරි සර් එයාගෙ අතේ තිබ්බ සුළු මුදලත් ගෙවලා , මගෙ කන් පරීක්ෂා කරවලා එතැනින් මට ශ්‍රවණාධාරකයක් හදවලා දෙන්න කටයුතු කළා..මට දැනුණු සතුට කියාගන්න බැරි තරම් සතුෂ්මි.

" Thank you so much sir.. මාත් සර් වගේ ම හොඳට ඉගෙනගෙන හොඳ තැනකට ඇවිත් සර් ව අනිවාරෙන් මුණ ගැහෙන්නම්.."

" දුව මටත් වඩා හොඳ තැනකට එන්න ඕන ... දුවගේ මූණෙ පිං පාට දැක්කාම ඒක එහෙම ම වෙයි කියලා අනුමාන කරන්න පුළුවනි... අපි වගේ අයට මේ ලෝකෙන් ප්‍රශංසාවලට වඩා ගැරහුම් තමා හම්බ වෙන්නෙ .. ඒත් එහෙම  අපි ව වට්ටන්න හදන අයට අපි දිනලා ම පෙන්නන්න ඕන...  අපි ව එයාලාගෙ ඇනුම් බැණුම්වලින් මුදවාගන්න කවුරු හරි කෙනෙක් කවදාහරි ඒවි .. "

මගෙ ඔලුව අතගාන ගමන් සර් එහෙම කිව්වා.

" සර් දැන් මේ කොහෙ ද යන්නෙ ?"

" මට අද ගුරු පත්වීම ලැබෙනවා දුව...සාමාන්‍ය උපාධියට වඩා වැඩිදුර ඉගෙන ගත්ත නිසා කල්ගියා උපාධිය ගන්න... දුව එහෙනම් පරිස්සමට යන්න..."

මං සර්ට ආපහු ස්තූති කරලා ක්ලාස් එකට යන්න පාර පනින්න ලෑස්ති වෙලා හිටියෙ.එතකොට ම මට හිටපු එකම යාලුවාගෙන් කෝල් එකක් ආවා මගෙ බටන් ෆෝන් එකට .

" ගුඩ් මෝනිං යශෝ... මොනවද බං මෙච්චර වෙලා කරන්නෙ ... වරෙං ඉක්මණට මෙහෙ ක්ලාස් එක පටන් ගන්න යන්නෙ ..."

කියලා කෝල් එක කට් කරා..කෝල් එකේ සිහියෙන් තමා මං පාර පනින්න ගියේ.

ලොරියක් හෝන් කරගෙන එන බව මට ඇහුණෙ නෑ.. මම දැක්කෙත් නෑ... මගෙ වාසනාවට , මං ක්ලාස් එකට යනකං බලා හිටපු අශ්වින් සර් ඒක දැකලා තිබුණා..

## එයා දුවගෙන ඇවිල්ලා මා ව එහා පැත්තට තල්ලු කරා... ඒත් එක්කම...

* * * * * *

යශෝධා මෙනෙවියට පවසන්නට හැකි වූයේ එපමණෙකි. ඇය සතුෂ්මිගේ උරහිසෙහි හිස තබා කුඩා දරුවෙකු මෙන් හීල්ලුවා ය. සතුෂ්මි ද සිටියේ මෙවැනි මිනිසත් බව පිරුණු මිනිසුන් මෙලොව තවමත් ඉන්නවා දැ' යි අදහා ගනු නොහැකිව ය.

" I destroyed his whole life..."

යශෝධා මෙනෙවිය කෑ ගසා හැඬුවා ය.

" මං එදා සිහියෙන් හිටියා නම්තාමත් එයා ජීවතුන් අතර ... මං එයාගෙ විතරක් නෙමෙයි , එයාගෙ අම්මාගෙ , තාත්තාගෙ , නැන්දාගෙ , ඒ හැමෝගෙ ම හීන බොඳ කරලා දැම්මා ..."

" අඬන්න එපා මැඩම් .. ඒක එයාගෙ කර්මය වෙන්න ඇති.. පොතේ තිබුණු විදිහට , ඒක එයා උපන් දා ඉඳන් තිබ්බ අනාවැකියක් නේ... ඒක අපි කාටවත් වෙනස් කරන්න බෑ.... Nobody can change it ..."

සතුෂ්මිගේ එම වදන් අසා ඇය දිගු සුසුම් කීපයක් හෙළුවා ය. මඳ අස්වැසිල්ලක් ලැබුණ ද පෙර තිබූ වරදකාරී හැඟීමෙහි නම් අඩුවක් නොවුණි.

" එදා එයා කියපු ආබාධිත අයට , එයාලට ලැබෙන ගැරහුම්වලි මුදා ගන්නා පුද්ගලයා බවට පත්වෙන්න මං උත්සාහ කළා... මට එයාගෙ funeral එකටවත් යන්න වුණේ නැහැ..ඉස්කෝලෙන් permission දීලා නැති තැන්වලට යන්න අපිට බැහැනේ.... මං permission අරන් තිබුණෙ ක්ලාස් එක දක්වා විතරයි.. කන් පරීක්ෂා කරන තැනට යන්න පුළුවන් වුණෙත් එතැනත් ඒ route එකේම හම්බෙන තැනක් නිසා... මට මේ diary එක හම්බුණෙත් අහම්බෙන්.. සර්ගේ බෑග් එකේ තිබිලා... කොහොමහරි සර්ට වෙච්ච පොරොන්දුව ඉටු කරන්න මං පුළුවන් උපරිම විදිහට මහන්සි වුණා... ඒකෙ ප්‍රතිඵලයක් විදිහට තමයි මීට මාස දෙක තුනකට කලින් මා ව ' ආබාධිත පුද්ගලයන් පිළිබඳ මහලේකම් කාර්‍යාලෙයේ සහකාර අධ්‍යක්ෂිකා තනතුරට තේරී පත් වුණේ... එදා සර් ව හම්බ නොවෙන්න මං කොහොමත් අයාලෙ යන නිකම් ම නිකං අනාථ කෙල්ලෙක් වෙන්න තිබුණා ..."

" ඒත් මැඩම් , සර් වෙනුවෙන් මැඩම්ට කරන්න පුළුවන් දෙයක් තියෙනවා... ඒක ඒ විදිහට කළොත් මැඩම්ට පුළුවන් වෙයි දැන් ඔය දැනෙන වරදකාරී හැඟීමෙන් මිදෙන්න..."

" ඒ මොකක් ද සතුෂ්මි ? "

" මැඩම් , අශ්වින් සර්ගෙ last hope එක වුණේ එයා වගේ ම ළමයින්ට උදවු කරන එක.. අසෝකා නැන්දාගෙ වුණත් ඒකමයි.. අශ්වින් සර් වගේ ම දුෂ්කර ගම්මානවල ඉපදිලා , ඒ වගේ ම ආබාධ හින්දා දුක් විඳින ළමයි අදටත් මේ ලංකාවෙ ඉන්නවා ඕන තරම්... ඉතින් මැඩම්ට පුළුවන් ඒ ළමයින්ට උදවු කරන්න, අශ්වින් සර්ගෙ නමින් ග්‍රාමීය මට්ටමින් මොකක්හරි project එකක් පටන් ගන්න... "

" දැන් ම call එකක් ගන්න සතුෂ්මි director සර්ට... Do it just now..."

* * * * * *

විවිධ දුෂ්කරතාවලින් පීඩා විඳින ආබාධිත දරුවන් උදෙසා වෙන් වූ ' **අශ්වින් පදනම** ' හෙවත් ' **ASHWIN FOUNDATION** ' ගොඩනඟාගැනීමට යශෝධා මෙනෙවිය හා ඇගේ පෞද්ගලික ලේකම් වූ සතුෂ්මි අඩිතාලම සකස් කළේ එලෙසින් ය. එහි දැක්ම ලෙස , අශ්වින්ගේ දිනපොතෙහි මුල් පිටුවෙහි වූ වදනක් යෙදීමට යශෝධා මෙනෙවිය තවදුරටත් අපේක්ෂා කළා ය.

' ***There is no greater disability in society , than the inability to see a person as more. '***

***- Robert M. Hensel***

***' පුද්ගලයෙකු වඩා උසස් ලෙස දැකීමට ඇති නොහැකියාවට වඩා , විශාල ආබාධයක් සමාජයේ නැත. '***

***- රොබට් එම්. හෙන්සල්***

නිමි...

# ස්තූතිය

පොත් ලිවීමට

මා යොමුකර

දිරිගැන්වූ

සියලු ම දෙනාට